**වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

# වී අලෙවි මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

වී අලෙවි මණ්ඩලයේ පද්ධති පරිපාලක, සහකාර ප්‍රාදේශීය කළමනාකරු හා කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### පද්ධති පරිපාලක - (JM 1-1) (II ශ්‍රේණිය)

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත දක්වා ඇති සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5 සපුරා තිබිය යුතුයි)**

01. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය පිළිබඳ උපාධිය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත / වාණිජ ආයතනයක එක් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට (පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය) ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ එක් අවුරුද්දක් පළපුරුද්දක් ලබා තිබීම.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය සම්බන්ධයෙන් ලබා ගැනීමෙන් පසු එක් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය සම්බන්ධයෙන් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත / වාණිජ ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

05. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය පිළිබඳ ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත / වාණිජ ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත දක්වා ඇති 1 හෝ 2 හෝ 3 සපුරා තිබිය යුතුයි)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
03. කළමනාකරණ සහකාර – තාක්ෂණ (MA 2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(ඇ) වැටුප් ක්‍රමය** - JM 1-1 2016, රු. 42,600-10x755-18x1135 - රු. 70,580

**වයස් සීමාව** - අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩිය විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### සහකාර ප්‍රාදේශීය කළමනාකරු - (MA - 3) (III ශ්‍රේණිය)

**(අ)අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

**(ආ) වෙනත් සුදුසුකම්**

ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මනා පරිචය සහ පරිගණක ප්‍රවීණතාවය, පරිපාලනය, කළමනාකරණය, ගණකාධිකරණය, අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය යන විෂයන් සම්බන්ධයෙන් වන දැනුම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(ඇ) වැටුප් ක්‍රමය** - MA3-2016, රු. 32,200-10x445-11x660-10x730-5x750 - රු. 54,960

**වයස් සීමාව** - අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### කළමනාකාර සහකාර - (MA 1-1) (III ශ්‍රේණිය)

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළු විෂයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම.
02. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයන් 03 ක් එකවර සමත් වීම.
03. පරිගණක ප්‍රවීණතාවය හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක්සේ සැලකේ.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

පහත සඳහන් නියමයන්ට යටත්ව ආයතනයේ ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය නොවන හා ශිල්පීය ගණයට අයත් සේවකයින්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

**(අ)** ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ (1) සුදුසුකම අදාළ වේ.

**(ආ)** සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, පත්වීම් ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

**(ඇ)** නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවු. 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**(ඇ) වැටුප් ක්‍රමය** - MA 1-1 2016, රු. 27,910-10x300-07x350-04x495-20x660 - රු. 48,540

**(ඈ) වයස් සීමාව** - අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. සීමිත තරග විභාගය හෝ අභ්‍යන්තර ඉල්ලුම්පත් කැඳවීම මගින් බඳවා ගැනීමේදී උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා දයකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- පත්වීම්ලාභීන් අදාළ වැටුප් ක්‍රමයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලබන අතර, රජය විසින් අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.
- ජීව දත්ත තොරතුරු ඇතුළත් තමා විසින් සකස් කර ගන්නා ලද අයදුම්පතක් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කරන ලද ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ඇතුළත්ව **2021.02.02 දිනට පෙර** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන), වී අලෙවි මණ්ඩලය, 6 වන මහල, නිවාස මහලේකම් ගොඩනැගිල්ල, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කළ යුතුය.
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.
- පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීම / සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම නුසුදුස්සෙකු වීමට හේතුවේ.
- සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගනු ලබන සහකාර ප්‍රාදේශීය කළමනාකාර නිලධාරීන් පුරප්පාඩු පවතින උතුර / නැගෙනහිර / ඌව / උතුරු මැද පළාත්වල සේවා ස්ථානවලට අනුයුක්තව සේවය කිරීමට සිදුවිය හැක.
- පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති,**
**වී අලෙවි මණ්ඩලය.**